# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## ''මාතර සමය'' සංවිධානය (සංස්ථාගත කිරීමේ)

**මාතර සමය සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
2016 ජනවාරි මස 26 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජනවාරි මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

[63 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## ''මාතර සමය'' සංවිධානය (සංස්ථාගත කිරීමේ)

## ''මාතර සමය'' සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"මාතර සමය" සංවිධානය යනුවෙන් හඳුන්වනු ලබන හා ප්‍රකට සංවිධානයක්, එකී සංවිධානයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී සංවිධානයේ සියලු පරමාර්ථ හා එම සංවිධානය හා සම්බන්ධ සියලු කාරණා සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබූ හෙයින් ද:

එකී සංවිධානය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එම පරමාර්ථ හා කාරණා එකී සංවිධානය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී සංවිධානය සංස්ථාගත කරවා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක     දරන ''මාතර සමය'' සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මාතර සමය සංස්ථාගත කිරීම.

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ ඉන් පසුව (මෙහි මින් මතු ''සංවිධානය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මාතර සමය සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) මාතර සමය සංවිධානය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද එම පොදු පරමාර්ථ පහත සඳහන් පිරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:—

(අ) පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදයි ලෙස ඉටු කර ගැනීමට පහසුවන පරිදි එම ආයතනය සඳහා භෞතික හා ගුණාත්මක වශයෙන් ආධාර හා අනුබල ලබා දීම;

(ආ) ආධාර ලැබීමට සුදුසු විශ්වවිද්‍යාල හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාරක සේවා පැවැත්වීම, ආධාර ලබා දීම හා ත්‍යාග ලබාදීම, පුස්තකාල සේවා පහසුකම් ලබා දීම, ඉගෙනුමට අවශ්‍ය උපස්ථම්භයන් ලබා දීම;

(ඇ) ජාතික මට්ටමේ විභාගයන් වන ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය, අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා විශේෂ ආධාරක වැඩසටහන්, ඇගයීම් වැඩසටහන් ක්‍රියාවට නැංවීම;

(ඈ) ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා අධ්‍යාපන නිලධාරීන්ගේ සේවය ඇගයීම, ඔවුන්ට පෙළඹී ක්‍රියා කිරීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කර දීම හා උපකාර ප්‍රදානය කිරීම;

(ඉ) ග්‍රාමීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටම්වල ශිෂ්‍යයන්ගේ හා තරුණයන්ගේ ක්‍රීඩා, සාහිත්‍යය හා කලා වැනි ක්ෂේත්‍රයන්හි සහජ හැකියාවන් හඳුනාගැනීම සහ ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සකස් කරදීම මගින් ඔවුන්ගේ සහජ හැකියාවන් වැඩි දියුණු කරගැනීම සඳහා දිරිගැන්වීමට;

(ඊ) පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සංස්කෘතික නිපුණතා සංවර්ධනය සඳහා නිපුණතා ප්‍රදර්ශනය කිරීමට, ඇගයීමට විධිවිධාන යෙදීම හා දක්ෂතා ඇති සිසුන් සඳහා සම්මාන සහතික ප්‍රදානය කිරීම;

(උ) සාරධර්ම හා ආචාර ධර්ම අගයන ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන සිසු පරපුරක් නිර්මාණය කර ගැනීමට හැකිවන පරිදි විශේෂිත වූ පුහුණු වැඩසටහන් ක්‍රියාවට නැංවීම;

(ඍ) දහම් පාසල් ගුරුවරුන්, පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වැඩමුළු, සාකච්ඡා, සම්මන්ත්‍රණ පැවැත්වීම හා පෙර පාසල් අලුතින් ආරම්භ කිරීම සඳහා දිරි දීම;

(එ) විශ්වවිද්‍යාල හා පාසල්වල ජ්‍යෙෂ්ඨ සිසුන් සඳහා නායකත්ව හුරුව සහ ජීවත්වීමට, ඉගෙනුමට, පාදක වන නායකත්ව කඳවුරු හා වැඩමුළු ක්‍රියාවට නැංවීම;

(ඒ) සනීපාරක්ෂාව, සෞඛ්‍ය පුරුදු පිළිබඳ වැඩසටහන් හා ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාස වැඩසටහන් තුළින් සිසු පරපුරේ ශාරීරික ශක්‍යතාව ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාවට නැංවීම;

(ඔ) ශ්‍රී ලංකාවේ උරුමයන්, පරිසරය, වන ජීවීන්, ජනගහනය, දේශාභිමානය වර්ධනය වීමට පාදක වන පරිදි අධ්‍යාපන චාරිකා, ශ්‍රමදාන, වැඩමුළු සංවිධානය හා මෙහෙයවීම;

(ඕ) බාලදක්ෂ ව්‍යාපාරය, පරිසර නියමු භට හා ශිෂ්‍යභට කණ්ඩායම් පාසල් තුළ ඇති කිරීම සඳහා ආධාර හා අනුබල ලබා දීම;

(ක) ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධාන විසින් ඉටු කරනු ලබන සේවා පහසුකම් සඳහා ආධාර කිරීම හා එම සංවිධාන දිරි ගැන්වීම;

(ග) දැනට ක්‍රියාත්මක වන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්, විශේෂ අධ්‍යාපන වැඩසටහන් හා වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් සඳහා පූර්ණ අනුග්‍රහය ලබාදීම හා ආධාර ලබා දීම;

(ච) සාම්ප්‍රදායික හා අපනයන කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් දිරිගැන්වීම, ඔවුන් දැනුවත් කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම;

(ඡ) විරැකියාවෙන් පෙළෙන තරුණ ප්‍රජාව ස්වයං රැකියාවලට යොමු කිරීමට අවශ්‍ය ආධාර හා අනුබලය ද, පුහුණුව ද ලබා දීමට කටයුතු කිරීම;

(ට) සංස්ථාවේ පරමාර්ථවලට හා සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම;

(ඩ) ජනයාගේ බුද්ධි වර්ධනයට අදාළ වූ ශාස්ත්‍රීය දේශන, සම්මන්ත්‍රණ, විධායක ක්‍රියාකාරී මග පෙන්වීම, අදාළ වූ ප්‍රදර්ශන හා අධ්‍යාපනික, ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ණ) මාතර දිස්ත්‍රික්කයෙන් බිහිවී දිස්ත්‍රික් පළාත් හා ජාතික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ හා දිස්ත්‍රික්කයට කීර්තියක් අත්කර දුන් පිරිස් සඳහා "මාතර පුත්‍ර සම්මාන උළෙලක්" සංවිධානය කිරීම; සහ

(ත) මාතර දිස්ත්‍රික්කයේ පාරිසරික උරුම රැකගැනීම සඳහා ආවේණික ශාඛ හා සත්ව වර්ග ආරක්ෂා කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

(ද) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික විය හැකි වෙනත් සියළු කටයුතු සහ ක්‍රියාමාර්ග ගැනීම.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාවලට යටත්ව සංස්ථාවට:— සංස්ථාවේ බලතල.

(අ) බැංකු ගිණුම් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ද;

(ආ) පරිත්‍යාගයන් සහ ප්‍රදානයන් එකතු කිරීමට හෝ භාරගැනීමට සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ලබා ගැනීමට ද;

(ඇ) කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට. සංස්ථාවේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ කිසියම් අරමුදල් ආයෝජනය කිරීමට ද;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමට, අත්කර ගැනීමට, බදු දීමට

හෝ කුලියට දීමට, විකිණීමට හෝ අන්‍යාකාරයකින් ලබාගැනීමට සහ තත්කාර්ය සඳහා නීත්‍යනුකූලව අත්කර ගැනීමට ද, සංස්ථාවේ පරමාර්ථ නංවාලීමේ අරමුණ ඇතිව අවස්ථානුකූලව යැයි පෙනී යන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ බැහැර කිරීමට ද;

(ඉ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවන ආකාරයෙන් සේවකයන් පත් කිරීමට, සේවයේ යෙදවීමට සහ පහකිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඔවුන්හට අදාළ පාරිශ්‍රමිකයන් ගෙවීමට ද ;

(ඊ) සංස්ථාවෙහි බලතල ක්‍රියාත්මක කිරීමේ හෝ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සංස්ථාව වෙනුවෙන් කටයුතු කිරීමට බලය ලබා දී ඇති යම් නිලධරයෙකු හෝ අනුයෝජිතයෙකු තුළින් හෝ සෘජුවම හෝ එවැනි සෑම සියළු ගිවිසුම් හෝ එකඟතාවන්ට ඇතුළු වීමට, ඉටු කිරීමට හෝ ක්‍රියාවට නැංවීමට ද;

(උ) කළමනාකරණ කමිටුව තීරණය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවෙහි ඕනෑම කටයුත්තක් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය විටක දී උපදේශාත්මක සභා, කමිටු හෝ උපකමිටු පත් කිරීමට ද, බලය ඇත්තේ ය :

එසේ වුවද, සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සංස්ථාව විසින් මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන හය දෙනෙකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ

කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සාමාජිකයෙකුගේ නාම යෝජනා කිරීමේ හෝ නිලවරණයේ හෝ කිසියම් දෝෂයක් නිසා සහ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම යන හේතු මත පමණක් කළමනාකරණ කමිටුවේ ක්‍රියාවක් හෝ ක්‍රියාපටිපාටියක් හෝ අවලංගු වූවා සේ නොසැළකිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සංවිධානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, එම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්, මෙම පනතේ 6 වැනි වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව නව කළමනාකරණ කමිටුවක් පත් කරන තෙක් ධුර දැරිය යුත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කළ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූලව වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කරගැනීම සහ එහි බලතල, කාර්යය, චර්යාව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලයන්;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනු නියෝජිතයන් සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වලදී සාකච්ඡා කළ යුතු කාරණා ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සහ එකී අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වැනි උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයටම සහ එවැනිම වූ රැස්වීමක දී සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ සාමාජිකයන්ගේ නාමලේඛනය.**

**7.** කළමනාකරණ කමිටුවේ ලේකම්වරයා විසින් සංස්ථාවේ සාමාජිකයන්ගේ සාමාජික නාම ලේඛනයක් නඩත්තු කළ යුතු ය.

**සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරීම.**

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කරගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහිලා බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ විධිවිධාන සහ සංස්ථාවේ 6 වැනි වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග හෝ ආධාර මුදල් වශයෙන්

මින් පෙර හෝ මින් මතු සියලු මුදල් සංස්ථාවේ අරමුදල් වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ දේපළ වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම හෝ පුනරුත්ථාපනය කිරීමේ අරමුණු සඳහා සංස්ථාව විසින් ක්ෂය නිදන් අරමුදලක් පිහිටුවිය හැකි ය.

(3) සංස්ථාවෙහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

සංවිධානය විසින් ගෙවිය යුතු සහ සංවිධානයට අයවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංවිධානයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ සංවිධානය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ වගකීම් බේරුම් කිරීම හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එවැනි සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජිකත්ව ගාස්තුව ඉක්මවා යම් සම්මාදමක් කිරීමට යටත් නොවිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාව විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැළැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් සේවයෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් සේවයෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක් අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සභාපති/කළමනාකාර අධ්‍යක්ෂකවරයා හෝ කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම්කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ එසේ කිරීමට පෙර හෝ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විසින් එවැනි ආයතනයන් තීරණය කළ යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් සුරැකීම.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.